# III මහ බැංකු ගිණුම් හා ගනුදෙනු

1961 වර්ෂය සඳහා මහ බැංකුවේ මුදල් පිළිබඳ ගිණුම ii වැනි පරිශිෂ්ටයෙහි 6 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1960 වර්ෂය හා සැසැඳීමේ දී දක්නට ලැබෙන ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

| | වෙනස්වීම් | |
|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම් | + 128. 3 | + 15. 0 |
| ව්‍යවහාර මුදල් සංසරණය | + 119. 2 | + 18. 5 |
| ඉල්ලුම් තැන්පතු | + 9. 1 | + 4. 3 |
| [ඉන් වෙළෙඳ බැංකු] | — 53. 6 | — 38. 2 |
| ජාත්‍යන්තර සංචිතය | — 5. 5 | — 2. 9 |
| දේශීය වත්කම් | + 142. 4 | + 18. 2 |
| රජයේ සහ රජය සහතික කළ සුරැකුම් පත් | + 140. 9 | + 24. 8 |

\+ වැඩිවීම

– අඩුවීම

1960 අවසානයේ දී ව්‍යවහාර මුදල්වල සහ ඉල්ලුම් වගකීම්වල ජාත්‍යන්තර සංචිතයට පැවැති අනුපාතය සියයට 22.2 ක් විය. මෙය 1961 අවසාන වන විට සියයට 18·8 කට අඩුවිය.

රන්පවුම් – ඩොලර් ගාස්තුවල වෙනස්වීම්වලට අනුරූපව ඇමෙරිකානු ඩොලරයක මහ බැංකු ගාස්තුව (1 ආ – පරිශිෂ්ටයෙහි දක්වා ඇති පරිදි) කලින් කලට වෙනස් වෙයි.

රන්පවුමෙහි සහ ඉන්දීය රුපියලෙහි මහ බැංකු ගාස්තුවල වෙනෙසක් අවුරුද්ද තුළ ඇති නොවිණි එම ගාස්තු පහත දැක්වේ.

| | | විදුලි පනිවිඩ මගින් මිලට ගැනීම් | විදුලි පනිවිඩ මගින් විකිණීම් |
|---|---|---|---|
| රන්පවුම් (ලංකාවේ රුපියලකට) | එතැන් | සි. 1. පැ. 6 3/64 | සි. 1. පැ. 6 1/32 |
| | ඉදිරි | එතැන් සඳහා මසක වට්ටම් මිල | එතැන් සඳහා මසක වාරිකය |
| | (සමසක් දක්වා) | පැ. 1/128 | පැ. 1/128 |
| ඉන්දියානු රුපියල් | එතැන් | රු. 99 3/4 | රු. 99 13/16 |
| (සියයට) | ඉදිරි | එතැන් සඳහා මසක වට්ටම් මිල රු. 1/32 (රුපියලෙන්) | එතැන් සඳහා මසක වාරිකය රු 1/32 (රුපියලෙන්) |

මහ බැංකුවේ සම්පූර්ණ විදේශීය මුදල් ගනුදෙනු 10 වැනි සංඛ්‍යා සටහනේ දැක්වේ. එතැන් මිල දී ගැනුම්වල වටිනාකම රු. කෝටි 34.21 ක්වූ අතර, එතැන් විකුණුම්වල වටිනාකම රුපියල් කෝටි 50 31 ක් විය. 1960 වර්ෂයේ මේවායේ වටිනාකම පිළිවෙළින් රු. කෝටි 16.23 ක් සහ රුපියල් කෝටි 49 87 ක් විය. ඉදිරි මිල දී ගැනුම් සඳහා බැඳුන ගිවිසුම්වල වටිනාකම රුපියල් කෝටි 22.18 විය (1960 රු. කෝටි 21·85 කි.) ඉදිරි විකුනුම් සඳහා ගිවිසුම්වල වටිනාකම රු. කෝටි 6.16 ක් විය (1960 රු. කෝටි 14.25 කි.) ඉදිරි මිල දී ගැනුම් යටතේ, ගිය අවුරුද්දේ ඉතිරිව තුබූ මුදල් ද සමග රුපියල් කෝටි 23.05 ක් ලැබුණු අතර ඉදිරි විකුණුම් ගිවිසුම් අනුව විකිණි ප්‍රමාණය රුපියල් කෝටි 7.44 ක් විය මිලට ගත් මුළු ප්‍රමාණය (ඉදිරි ගිවිසුම් යටතේ එතැන් සහ ලැබුණු) රුපියල් කෝටි 57·26 ක් විය. විකිණි මුළු ප්‍රමාණය රු. කෝටි 57.75 ක් විය.

## ව්‍යවහාර මුදල් නිකුතුව.

වර්ෂය තුළ දී මහ බැංකුව ප්‍රථම වරට ලෝහමය නූලක් කවන ලද රු. 10, 5 සහ 1 නෝට්ටු නිකුත් කරන ලදී. මෙයට පෙරතුව නිකුත් කරන ලද මේ වටිනාකම්වල නෝට්ටු ද අළුත් නෝට්ටු සමග භාවිතා වෙයි.

## ආදායම සහ වියදම

මේ අවුරුද්දේ මහ බැංකු ආදායම රු. 2,43,88,121 44 ක් විය මුදල් පනතේ 38 වැනි වගන්ති ප්‍රකාර සංචිත සඳහා වෙන් කරන ලද රු. 1,10,92,487 89 ඇතුළුව අවුරුද්දේ මහ බැංකුවේ වියදම රු. 1,93,88,121 44 ක් විය. ශුද්ධ ලාභය වූ රු: 50,00,000 මුදල් පනතේ 39 (ආ) වගන්ති ප්‍රකාර අතිරික්තයට බැර කරන ලදී. එසේ කරන ලද්දේ 1961 දෙසැම්බර් අවසානයේදී මහ බැංකුවේ ප්‍රාග්ධන ගිණුමෙහි එකතුව මුළු බැංකු වත්කම් සහ මහ බැංකුවේ විදේශීය මුදලින් වන වත්කම් අතර වෙනසින් සියයට 15 කට අඩු වූ නිසාය දැනට ඇති අතිරික්තය රුපියල් කෝටි 3 0 කි.

## බැංකු පරිපාලනය

මුදල් නීති පනතේ 29(1) වගන්ති ප්‍රකාර බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් 1961 වර්ෂයේ දී වෙළෙඳ බැංකු 2 ක් ද මුදල් නීති පනතේ 29 (2) වැනි වගන්ති ප්‍රකාර මුදල් මණ්ඩලයේ විධානයට අනුව, වෙළෙඳ බැංකු නොවන බැංකු ආයතන 2 ක් ද පරීක්ෂා කර බලන ලදී.

1957 අංක 42 දරන බැංකු හර බදු පනතේ ක්‍රියාත්මක කැරීමෙහිලා සම්භර කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී